තොරතුරු මාසිකය

විමර්ශන

2023 ජූලි
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# IMF ඉලක්ක සහ අපේ ආර්ථිකය

**ලංකාවේ ආර්ථික අර්බුදයට IMF කරනු ලබන යෝජනා සහ ඒ වෙනුවෙන් ආර්ථිකය අත්පත් කරගත යුතු ඉලක්කද ඔවුන් විසින් හඳුන්වා දී තිබේ. මෙම ඉලක්ක අත්පත් කර ගැනීමට ලංකා රජයට කුමන හෝ වැඩපිළිවෙළක් නොමැති බව දැනටමත් හොඳටම තහවුරු වී තිබේ. IMF දෙන ලද ඉලක්ක සහ 2023 වසරේ මුල් මාස 05හි ආර්ථිකයෙහි හැසිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික දත්ත ඇසුරෙන් සැසැඳීමක් කිරීම මගින් එම ඉලක්ක කොතෙක් දුරට අත්පත් කරගත හැකිද යන්න ගැන අදහසක් ලබා ගත හැකිය.**

| IMF ඇස්තමේන්තුවට අනුව ආනයන/අපනයන එ.ජ. ඩොලර් මිලියනවලින් | | | | | | |
|---|---|---|---|---|---|---|
| විස්තරය | 2022 | | 2022 (ජන - අප්‍රේල් ) | | 2023 (ජන - අප්‍රේල්) | |
| | ආනයන | අපනයන | ආනයන | අපනයන | ආනයන | අපනයන |
| ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවලට අනුව | 18,291 | 13,106 | - | - | 6,865 | 4,555 |
| IMF ඇස්තමේන්තුවට අනුව වෙනස | 18,291 | 13,106 | 7,350 | 4,225 | 5,290 | 3,847 |
| | | | | | 1,575 | 708 |
| (01 වගුව) | | | | | | |

ඉහත 01 වගුව මගින් පැහැදිලි කරනු ලබන්නේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් දෙන ලද නිර්ණායක සහ සත්‍ය දත්ත අතර සැසැඳීමකි.

ඉහත සංඛ්‍යාලේඛනයට අනුව **IMF** බලාපොරොත්තු වන ආනයන වියදම ඩො.මි. 6,865කි. **IMF** එක ආනයන නීති ලිහිල් කිරීමට යෝජනා කර ඇත්තේ මෙලෙස ආනයන වැඩි කිරීමේ අරමුණිනි. එය අර්බුදයට යන ගෝලීය ධනවාදයට වෙළෙඳපොළවල් සොයන ක්‍රියාවලියේ පියවරයන්ය. එහෙත්, ලංකාව පළමු මාස 04 සඳහා ආනයනය කර ඇත්තේ ඩො.මි. 5,290කි. ඒ අනුව ඩො.මි. 1,575ක් අඩුවෙන් ආනයනය කර ඇත. කෙනකුට මෙය හොඳ සහ වාසිසහගත ප්‍රවණතාවක් ලෙස අර්ථකථනය කළ හැකිය. එහෙත්, ලංකාවේ ආනයන තුළ බොහෝවිට අන්තර්ගත වන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ නිසා මෙම තත්ත්වය තරමක් දුරට වෙනස් වේ. අපගේ ආනයන අඩුවීම යනු නිෂ්පාදනයට අවශ්‍ය තරම් අමුද්‍රව්‍ය සහ පරිභෝජනයට අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය අඩු කිරීමක්ය. එයින් ඇතිවන අහිතකර ආර්ථික ප්‍රතිවිපාකය වන්නේ ආර්ථිකය හැකිළීමයි. අත්‍යවශ්‍ය ආනයන අඩුවීම තුළ නිෂ්පාදනය, රාජ්‍ය ආදායම, පරිභෝජනය අඩුවී යා හැකිය. 2022 ප්‍රථම මාස හතරට සාපේක්ෂව 2023 ප්‍රථම මාස හතරේ ආනයන අඩුවීම ඩොලර් මිලියන 2,060කි. එලෙසම අපනයන ආදායම ඩොලර් මිලියන 378කින් අඩුවී ඇත. මේ සියලු සංඛ්‍යා අනුව තහවුරු වන්නේ ආර්ථිකය දරුණු ලෙස හැකිළී ඇති බවයි.

| වරාය දේශීය බහාලුම් මෙහෙයුම් කටයුතු | |
|---|---|
| 2022 (ජන - මැයි) 20 සමාන ඒකක | 2023 (ජන - මැයි) 20 සමාන ඒකක |
| 487,170 | 375,090 |

අනෙක් අතට අපනයන ආදායමද බලාපොරොත්තුවූ ප්‍රමාණයට ලැබී නැත. මාස හතරට එහි අඩුව ඩො.මි. 708කි. බලාපොරොත්තු වන වෙළෙඳ ගිණුමේ පරතරයට වඩා අඩු පරතරයක් පැවැතීම ධනේශ්වර ආර්ථික විද්‍යාවට අනුව යහපත් එකක් වුවද, එය පසුගාමී ධනේශ්වර ආර්ථිකයක අර්බුද අවස්ථාවලදී එම සංකල්ප ප්‍රායෝගික නොවන බව මෙහිදී පැහැදිලි වේ.

| දළ දේශීය නිෂ්පාදනය (ස්ථාවර මිලට – රු.බිලියන) | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනය | 2022 ජන මාර්තු | 2023 ජන මාර්තු |
| | 3,519 | 3,114 |

මෙලෙසම පසුගිය වසරේ මුල් කාර්තුවට සාපේක්ෂව දෑදේනිඃ කඩාවැටීමක්ද දක්නට ලැබේ.

ඉහත සඳහන් කළ ආකාරයටම පසුගිය වසරේ මුල් කාර්තුවට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදනයේ කඩාවැටීමක් මෙම වසරේ මුල් කාර්තුවේද දක්නට ලැබේ. එය රුපියල් බිලියන 405කි. මෙය දිගින්දිගටම පැවතුණහොත්, බලාපොරොත්තු වන නිෂ්පාදනය අත්පත් කරගැනීමට නොහැකි වනු ඇත. 2022 මුල් කාර්තුව දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දී ලබා ගත් නිෂ්පාදනයවත් මේ වසරේ මුල් කාර්තුවේ නිපදවීමට නොහැකි වීම යහපත් කරුණක් නොවේ.

ලංකාවේ ආර්ථිකයේ හැකිළීම හුවාදක්වන තවත් වැදගත් නිර්ණායකයක් වන්නේ වරායේ දේශීය බහාලුම් මෙහෙයුම් කටයුතුයි. එය පහත සටහනින් දක්වා ඇත. ඒ අනුව 2022 වසරේ මුල් මාස 05ට සාපේක්ෂව 2023 වසරේ මුල් මාස 05 තුළ දේශීය බහලුම් මෙහෙයුම් කටයුතු 23%කින් කඩාවැටී ඇත. මෙම දේශීය බහාලුම් මෙහෙයුම් අඩුවීම විදේශ වෙළෙඳාමේ කඩාවැටීම තහවුරු කරන නිර්ණායකයක් ලෙසද ගත හැකිය.

මෙම ආර්ථිකයේ හැකිළීමට අනුරූපව මිනිසුන්ගේ පරිභෝජන මට්ටමද අඩුවෙමින් යනු ඇත. එයට තවත් හොඳම උදාහරණයක් සපයන්නේ ක්‍රෙඩිට් කාඩ් පහසුකම් ලබා ගත් ගනුදෙනුකරුවන් ඒවා ක්‍රියා විරහිත කරමින් පවතින සංඛ්‍යාවයි. පසුගිය ජනවාරි සිට අප්‍රේල් 07 පිටුවට

# තොරතුරු දැනගැනීමේ අයිතියට බාධා කරන යෝජිත විකාශන අධිකාරී පනත

**2022 සැප්තැම්බර් 09දා රැස්වූ කැබිනට් මණ්ඩලය විසින් විද්‍යුත් විකාශන නියාමනය සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීමට අමාත්‍ය අනුකමිටුවක් පත්කරන ලදී. අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂට මූලිකත්වය ලබා දුන් එම කමිටුවේ සෙසු සාමාජිකයන් වූයේ බන්දුල ගුණවර්ධන, කෙහෙලිය රඹුක්වැල්ල, නිමල් සිරිපාල ද සිල්වා සහ මනුෂ නානායක්කාරයි. ඔවුන් විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත පසුගිය මාසයේදී ශ්‍රී ලංකාවේ විද්‍යුත් විකාශකයන්ගේ සංගමය වෙත ලබා දෙන ලදී. මෙම පනත් කෙටුම්පත පිළිබඳව සමාජය දැනගත්තේ ඉන් අනතුරුවය.**

මෙම පනතේ මුඛ්‍ය අරමුණ රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා ඇතුළත් විද්‍යුත් නාලිකාවලින් විකාශනය වන දෙයෙහි අන්තර්ගතය නියාමනය කිරීම බව කෙටුම්පතේ සඳහන් වේ. ඒ සඳහා 'විද්‍යුත් විකාශන නියාමන කොමිසම' නමින් නව කොමිසමක් පත් කිරීමට නියමිතය. ශ්‍රී ලංකාව තුළ බලපවත්වන විද්‍යුත් නාලිකාවල තරංග ආයාම ලබාදීම සිදුකරනු ලබන්නේ විදුලි සන්දේශ නියාමන කොමිසම (TRC) විසිනි. දැනට පවතින ගුවන්විදුලි සංස්ථා පනත අනුව ගුවන්විදුලි සංස්ථාව හැර වෙනත් ගුවන්විදුලි නාලිකාවලට විකාශන බලපත්‍ර දීමේ අයිතියද, රූපවාහිනී සංස්ථා පනත අනුව රූපවාහිනියට හැර වෙනත් රූපවාහිනී නාලිකා සඳහා බලපත්‍ර දීමේ අයිතියද විෂයය භාර අමාත්‍යවරයා සතුවේ. මෙම පනතෙන් අමාත්‍යවරයා සතු අයිතිය කොමිසමට පැවරෙන බව ආණ්ඩුව ප්‍රකාශ කරයි.

යෝජිත විකාශන නියාමන කොමිසම සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වේ. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා එහි නිල බලයෙන් පත් වන සාමාජිකයන් වෙති. ඊට අමතරව ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය සහිතව ජනාධිපතිවරයා පත් කරන සාමාජිකයන් තිදෙනෙකි. මෙම පනත් කෙටුම්පත අනුව ජනාධිපතිවරයා විසින් පත් කරන සාමාජිකයන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායක සභාවේ හෝ පාර්ලිමේන්තුවේ කිසිදු අනුමැතියක් අවශ්‍ය නොවන අතර, ව්‍යවස්ථාදායක සභාවට කරන දැනුම් දීමකින් පමණක් ජනාධිපතිවරයාට සාමාජිකයන් තිදෙනා ඕනෑම වේලාවක ඉවත් කළ හැකිය. (මහජන උපයෝගීතා කොමිසමේ සභාපති ඉවත් කිරීම ජනාධිපතිවරයාට මීට වඩා දුෂ්කර කර තිබේ) ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ජනාධිපතිවරයා විසින් පත් කරන අතර, විදුලි සන්දේශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කරනු ලබන්නේ අදාළ විෂයය භාර අමාත්‍යවරයා විසිනි. එසේම මෙම කොමිසමේ ගණපූරණය තිදෙනෙකි. මෙම පත් කිරීම් හා ඉවත් කිරීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වන්නේ යෝජිත නියාමන කොමිසම කිසිසේත්ම ස්වාධීන ආයතනයක් නොවන බවයි. එසේම මෙම සාමාජිකයන් සඳහා දීමනා තීන්දු කිරීම විෂයය භාර අමාත්‍යවරයාගේ අභිමතය අනුව සිදුවෙයි. මෙම සියලු කරුණු එක්ව ගත් කල ආණ්ඩුව පිහිටුවන්නට යන්නේ මාධ්‍ය නියාමනය සඳහා වන රාජ්‍ය කොමිසමකි.




විද්‍යුත් විකාශන ආයතන පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත 'පැමිණිලි විමර්ශන කමිටුවක්' පත් කිරීමට යෝජිත කෙටුම්පතෙහි 19 වන වගන්තිය මඟින් කොමිසමට බලය ලබාදී තිබේ. එම විමර්ශන කමිටුවේ මූලිකත්වය දරන්නේ යෝජිත නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයාය. විශේෂ කරුණ වන්නේ එම විමර්ශන කමිටුවට අපරාධ විමර්ශන බලතලද ලබාදී තිබීමයි. රටේ අපරාධ විමර්ශනය සඳහා ආයතන පද්ධතියක් තිබියදී, අපරාධමය නොවන කටයුතු සඳහා අපරාධ විමර්ශන බලතල සහිත කමිටුවක් ක්‍රියාත්මක වීම මාධ්‍ය ක්ෂේත්‍රයේ දෝෂදර්ශනයට ලක්වූ ප්‍රධාන කරුණකි.

මෙම පනත් කෙටුම්පතේ කිසිදු තැනක නිශ්චිත වශයෙන් අර්ථ දක්වා නොමැති 'ජාතික ආරක්ෂාව', 'ජාතික ආර්ථිකය', 'ජාතික සමඟිය' ආදී ක්ෂේත්‍ර තර්ජනයට ලක්වීම පිළිබඳ ඕනෑම පැමිණිල්ලක් විභාග කිරීමට මෙම කමිටුවට හැකියාව තිබේ. ආණ්ඩුව විසින් ගනු ලබන ප්‍රතිපත්තියක් (උදා: රසායනික පොහොර එක රැයින් තහනම් කිරීමේ ගෝඨාභය රාජපක්ෂගේ තීන්දුව වැනි) පිළිබඳව ජනතාවගේ විරෝධතාවක් වාර්තා කිරීමද සමහරවිට ජාතික ආර්ථිකය යටතේ වරදක් ලෙස නිර්වචනය කිරීමට කොමිසමට හැකියාව තිබේ. එහිදී විද්‍යුත් විකාශන ආයතනය මඟින් සිදුවන වරදක් සඳහා බලපත්‍රය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම, තාවකාලිකව අහෝසි කිරීම, දඩ සහ සිරදඬුවම් පැමිණවීම ආදිය සඳහා කොමිසමට බලය තිබේ.

මෙම විද්‍යුත් විකාශන නියාමන කොමිසම පිහිටුවූ පසු ශ්‍රී ලංකාව තුළ පවතින සියලුම රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා මාස තුනක් ඇතුළත සිය විකාශන බලපත්‍ර අලුතින් ලබාගත යුතුය. එතැන් සිට සෑම වසරකම බලපත්‍ර අලුත් කිරීමට එම ආයතනවලට සිදුවේ. රුපියල් කෝටි ගණනින් වියදම් කර රූපවාහිනී හෝ ගුවන්විදුලි නාලිකාවක් ආරම්භ කළ ඕනෑම ආයතනයකට හෝ පුද්ගලයකුට මෙම වාර්ෂික දීර්ඝ කිරීම පිළිබඳව සිතාබැලීමකින් තොරව ප්‍රවෘත්ති හෝ කාලීන සිදුවීම් හෝ වාර්තා කළ නොහැකිය. තමන් වියදම් කළ මුදල සහ තමන් යටතේ සේවය කරන සේවක පිරිස පිළිබඳව අවධානය යොමු කරන ආයතන හිමිකාරීත්වය විසින් ඊළඟ වසර සඳහා විකාශන බලපත්‍රය දිගු කරගැනීමට අවශ්‍ය කරන 'ස්වයං හීලෑවීම' සිදු කරගනු ඇත. සමහර ජනමාධ්‍යවල සහ සමහර අවස්ථාවල ජනමාධ්‍යවල හැසිරීම පිළිබඳව සාධනීය විවේචනයක් සමාජයේ තැනින් තැන කතාබහ කරමින් තිබේ. නමුත්, වර්තමාන ආණ්ඩුව මේ සිදු කරන්නට යන්නේ සියලු විද්‍යුත් මාධ්‍ය තමන්ට අවනත සහ හීලෑ තත්ත්වයකට පත්කර ගැනීමයි.

මෙම පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැනගැනීමේ ජනතාව සතු අයිතියට බාධා කරන කෙටුම්පතකි. 1997 වසරේදී එවකට පැවැති ආණ්ඩුව විසින් මේ හා සමාන පනතක් ගෙන ඒමට දැරූ උත්සාහය ශ්‍රේෂ්ඨාධිකරණය මුළුමනින්ම පරාජයට පත් කළේය. මෙම පනත් කෙටුම්පත ගැසට් පත්‍රයක් ලෙස ඉදිරිපත්වූ පසු පාර්ශ්ව ගණනාවක් එයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට නියමිත බව වාර්තා වේ.

# ජූලි මාසය අඳුරැකර වසර හතළිහයි


**ලාංකීය දේශපාලන ඉතිහාසයේ ඇති අඳුරුම කළු පැල්ලම් අතුරින් වඩාත්ම අඳුරු කළු පැල්ලමක් වන්නේ 1983 'කළු ජූලිය' බව කිවහොත්, එය වැරැදි නැත. ඒ හරහා ලංකාවේ දේශපාලනයට සිදුකරන ලද බලපෑම ද සුවිශාලය. එසේ වුවත්, සමාජයක් ලෙස එහි සැබෑ මූලයන් මොනවා ද යන්න නිවැරැදිව හඳුනා නොගැනීම නිසා, 1983න් පසුව පවා වරින්වර මේ දක්වාම එවැනි සිදුවීම් එක් එක් හැඩයන්ගෙන් කලඑළි බැසීම වළකාලීමට අපොහොසත් වී තිබේ. ඒ නිසාම කළු ජූලිය පිළිබඳ ගැඹුරු කියැවීමක අවශ්‍යතාව සමාජය හමුවේ පවතී.**

## අත්තනෝමතික බලයක්

'80 දශකය ආරම්භ වන විටත් උතුරේ යුදමය වටාපිටාවක් වර්ධනය වෙමින් පැවැතිණි. එසේම 1977දී බලයට පත් ජේ. ආර්. ජයවර්ධන පාලනය නව ලිබරල්වාදී ආර්ථික පිළිවෙතකට රට යොමු කිරීම සඳහා සැලැසුම් දියත් කළේ ය. ඒ සඳහා විශාල අත්තනෝමතික බලයක් ගොඩනඟා ගත්තේ විධායක ජනාධිපති ක්‍රමය සහිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ද සම්මත කර ගනිමිනි. 1980 වැඩ වර්ජනය මැඩලූයේ දහස් ගණනකට රැකියා අහිමි කරමිනි. 1981 යාපනය සංවර්ධන සභා මැතිවරණයේ දී අන්ත දූෂිත ලෙස රාජ්‍ය බලය යෙදැවූ අතර, යාපනය පුස්තකාලය දවා හළු කළේ ආණ්ඩුවේ නොම්මර එකේ ජාතිවාදී නායකයන් විසින් මෙහෙයවනු ලැබූ මැර කල්ලි විසිනි. විරුද්ධ පක්ෂ සහ බලවේග මර්දනය කරමින්, 1982 ජනාධිපතිවරණය මඟින් ජේ. ආර්. තම දෙවන ධුර කාලය ආරම්භ කළේ ය.

## නැඟී එන ජ.වි.පෙ. තර්ජනය

ජනාධිපතිවරණ ප්‍රතිඵල අනුව 1983දී පැවැත්වීමට නියමිත මහා මැතිවරණයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයන්ගේ පාර්ලිමේන්තු පැමිණීම වැළැක්වීමට අපහසු බව ජේ. ආර්. පාලනය තෙරුම් ගෙන සිටියේ ය. ඒ නිසා එය වැළැක්වීමට මහා මැතිවරණය වෙනුවට ජනමතවිචාරණයක් පවත්වනු ලැබූ අතර, ආණ්ඩුවේ මැර බලය උපරිමයෙන් යොදවා එය අන්ත දූෂිත ලෙස කොල්ලකන ලදී. මෙයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය අතර, එය ආණ්ඩුවට විශාල අභියෝගයක් විය. ඒ අතර 1983 මැයි දින සමරුව වෙනුවෙන් ජවසම්පන්න පෙළපාළියක් ද, දැවැන්ත මැයි රැළියක් ද ජනතා විමුක්ති පෙරමුණ විසින් පවත්වන ලදී. මේ සියල්ල අනුව ජේ. ආර්. පාලනය තම අංක එකේ අභියෝගය ලෙස සැලැකිල්ලට ගත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. ඒ නිසා ජවිපෙ දේශපාලන භූමියෙන් ඉවත් කිරීම ඔවුන්ගේ ප්‍රධානම පංති අරමුණ වී පැවැතිණි.




එවකට පැවැති කලාපීය දේශපාලන ප්‍රතිවිරෝධතා සැලැකිල්ලට ගත් විට ද මෙය පැහැදිලි කර ගැනීම දුෂ්කර නොවේ. සමාජවාදී කඳවුරේ බලපෑම නිසාම එක්සත් ජනපදය දකුණු ආසියානු කලාපයේ තම දේශපාලන ඉත්තකු බවට ලංකාව යොදාගනිමින් පැවැතියේ ජේ. ආර්. පාලනය හරහා ය. රට තුළ වමේ බලයක් මතු වීම මහත් අනතුරක් ලෙස ඔවුහු නොසලකා හරිතැයි සිතිය නොහැකි ය.

## කළු ජූලියේ ආසන්න සිදුවීම්

1983 ජූලි මස මුල් භාගයේ දී රජයේ හමුදාව චාවාකච්චේරියේ දී එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් ඉලක්ක කර එල්ල කළ ප්‍රහාරයක දී එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආරම්භක සාමාජිකයකු ලෙස හැඳින්වෙන චාල්ස් ලූකස් ඇන්තනී හෙවත් 'සීලාන්' ඇතුළු කිහිප දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ. ඊට ප්‍රතිප්‍රහාරයක් ලෙස ජූලි 23වනදා ගුරුනගර් කඳවුරින් පිටවුණු හමුදා ජීප්රියකට සහ ට්‍රක් රථයකට එල්ටීටීය විසින් බෝම්බ සහ වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඉන් හමුදා සෙබළුන් දහතුන් දෙනෙක් මිය ගියහ.

මෙම ප්‍රහාරයෙන් සිදුවූ මරණ පිළිබඳ අවසන් කටයුතු කොළඹ, බොරැල්ල කනත්තේ දී සිදු කිරීමට ආණ්ඩුව කටයුතු සූදානම් කළේ ය. මළසිරුරු ඥාතීන්ට භාර නොදීම සම්බන්ධයෙන් මිය ගිය අයගේ ඥාතීන් අතරත්, සිංහල ජනයා අතරත් නොසන්සුන්තාවක් ඇති විය. මේ තත්ත්වය සිංහල ජාතිවාදී කණ්ඩායම් තම වුවමනාවන්ට යොදා ගත් අතර, දෙමළ ජනයාට එරෙහිව ප්‍රහාර සිදුවීම ආරම්භ විය. දේපළ විනාශ කිරීම්, පහරදීම්වල සිට අමානුෂික මිනිස් ඝාතන දක්වා මෙය රට පුරා පැතිර ගියේ ය.

24 වැනි දින සවස කොළඹට ඇඳිරි නීතිය පැනෙව්වත්, කලහකාරී ක්‍රියා නතර කිරීමට පොලිසිය කටයුතු කළේ නැත. ජූලි 25 වැනි දින වැලිකඩ අධි ආරක්ෂිත බන්ධනාගාරය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටි දෙමළ රැඳවියන් 37 දෙනකුට, ඒ තුළම සිටි සිංහල සිරකරුවන් විසින් පහරදී ඔවුන් මරා දමන ලදී. 26 වැනිදා රට පුරා ඇඳිරි නීතිය පනවන ලදී. එහෙත්, ප්‍රචණ්ඩ ක්‍රියා සම්පූර්ණයෙන් පාලනය නොවිණි. 28 වැනි දින ද වැලිකඩ සිරගෙදර තුළ දෙවැනි මනුෂ්‍ය ඝාතනය ද සිදු විය. එහිදී තවත් සිරකරුවන් 15 දෙනෙක් මිය ගියහ. 29 දින දක්වා ම රට තුළ දෙමළ ජනයාට එරෙහි තැනින් තැන ප්‍රචණ්ඩ ක්‍රියා සිදු විය.

## ජේ. ආර්.ගේ දැක්ම

මෙම ඛේදවාචකයට දින දොළහකට පෙර 'ඩේලි ටෙලිග්‍රාෆ්' පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් දුන් ජනාධිපති ජයවර්ධන ප්‍රකාශ කළේ, "දෙමළ ජනතාවගේ මතය ගැන මම කරදර වෙන්නෙ නැහැ. දැන් අපට ඔවුන් ගැනවත්, ඔවුන්ගේ ජීවිත ගැනවත්, ඔවුන්ගේ මතිමතාන්තර ගැනවත් හිතන්න බැහැ. ඇත්තටම මම දෙමළ අයව හාමතේ තියල මරා දැම්මොත් සිංහල ජනයා සතුටු වෙනවා ඇති" යනුවෙනි.

සිදුවීම් අවසානයේ අලාභහානි තක්සේරු කිරීමට රාජ්‍ය කාර්යසාධක බළකායක් පත් කෙරිණි. ඔවුන්ගේ තොරතුරුවලට අනුව කර්මාන්ත 116කට හානි සිදු වී, නිවාස 18,000ක් විනාශ වී, ජනතාව 1,00,000ක් අවතැන් වී සිටියහ. මිය ගිය ප්‍රමාණය 3,000ක් පමණ විය.

## භයානක ප්‍රතිඵල

රට පුරා සිංහල ජනතාව සමඟ සමඟියෙන්, සහජීවනයෙන් ජීවත්වූ දෙමළ ජනයා එම ප්‍රදේශවලින් සම්පූර්ණයෙන්ම පාහේ ඉවත්ව උතුරු ප්‍රදේශවලට සංක්‍රමණය වූ අතර, කිසියම්ම හෝ හැකියාවක් ඇති අය රට හැර ගියහ. සිදුවීමෙන් දශක ගණනාවක් ගතව තිබිය දීත්, ඒ බිහිසුණු තුවාළවල වේදනා සමනය කර ගැනීමට සිංහල හා දෙමළ සමාජය තවමත් සමත් වී නැත.

එසේම දෙමළ සන්නද්ධ ව්‍යාපාර වෙත දෙමළ තරුණ කොටස් වේගයෙන් ආකර්ෂණය වීමට ඒ ජූලි සිදුවීම් මහත් උත්ප්‍රේරකයක් විය. මරාගෙන මැරෙන ප්‍රහාරක කණ්ඩායම් සහිත ලොව දරුණුම හා බලවත්ම සන්නද්ධ සංවිධානයක් බවට පත්වීමට දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට විශාල පසුබිමක් සැකැසුණේ මෙමඟිනි.


07 පිටුවට

# ගැඹුරු සාගරයේ ගවේෂණ

**පෘථිවි ගෝලයෙන් 70%ක් පමණ ම ආවරණය වී ඇත්තේ සාගරවලිනි. මිනිසා විසින් මෙතෙක් ගවේෂණය කර ඇත්තේ ඉන් ඉතා සුළු ප්‍රදේශයක් පමණි. ඒ අතුරින් ද ගැඹුරු මුහුදේ ගවේෂණය කර ඇති භූමි ප්‍රමාණය ඉතාමත් කුඩාය.**

ධීවරයන්ට අනුව ගැඹුරු මුහුද යනු ගොඩබිමින් මඳක් ඈතට ගමන් කළ පසු ළඟාවන මුහුදු සීමාව වුව ද, සාගර ගවේෂණවලට අනුව ගැඹුරු මුහුද ලෙස සැලැකෙන්නේ සාමාන්‍යයෙන් හිරුගේ බලපෑමෙන් සාගර ජලයේ උෂ්ණත්වය අඩු හෝ වැඩි විය හැකි සීමාවටත් වඩා ගැඹුරු මුහුදු ප්‍රදේශයයි. එය සාමාන්‍යයෙන් ෆැතොම් 1,000කට (ෆැතොම් යනු ජලයේ ගැඹුර මනින ඒකකයකි. ෆැතොම් එකක් මීටර් 1.8ක් පමණ වේ.) වැඩි ගැඹුරු මුහුදු ප්‍රදේශය වේ. ගැඹුරු මුහුදේ ගවේෂණ සිදු කිරීම මෙතරම් අපහසු වී ඇත්තේ, සාගරයේ ගැඹුරට යත්ම අධික ලෙස පීඩනය වැඩි වීමත්, උෂ්ණත්වය අඩු වී අධික සීතලකින් යුක්ත වීමත්, සම්පූර්ණයෙන්ම අඳුරු පරිසරයක් පැවැතීමත් නිසා ය. හිරු එළියෙන් ලැබෙන ආලෝකය මීටර් 1,000ක පමණ ගැඹුරින් පසුව සම්පූර්ණයෙන් පාහේ අතුරුදන් වන අතර, ජලයේ ගැඹුරට ගමන් කරද්දී, සෑම මීටර් 10කට වරක්ම මුහුදු මට්ටමේ දී පවතින වායුගෝලීය පීඩනයට සමාන පීඩනයක් ද එක් වේ. මුහුදු මට්ටමේ දී වායුගෝලීය පීඩනය පැස්කල් 101,325කි. ඒ අනුව මරියානා අගාධයේ ගැඹුරුම ස්ථානයේ පීඩනය මුහුදු මට්ටමේ දී ඇති වායුගෝලීය පීඩනය මෙන් 1,100 ගුණයක් පමණ විශාල වේ. මුහුදු මට්ටමේ දී වායුගෝලීය පීඩනය යනු වර්ග අඟලක් මත රාත්තල් 14.7ක බරක් තැබුවාක් හා සමාන විශාල පීඩනයක් වන අතර, මරියානා අගාධයේ උපරිම ගැඹුරේ දී එය වර්ග අඟලක් මත රාත්තල් 16,000ක බරක් තැබුවා හා සමාන මට්ටමේ වේ. එවන් පීඩනයක් හමුවේ තැළී පොඩිපට්ටම් නොවන යාත්‍රා සැකසීමේ දුෂ්කරතාව ගැඹුරු මුහුද ගවේෂණයට පවතින ප්‍රධානතම බාධාව වී තිබේ. එවන් ගවේෂණ සඳහා අධික මුදලක් වැය වෙන බැවින්, රොබෝ තාක්ෂණය යොදා ගනිමින් ගවේෂණ සිදු කිරීමට වර්තමානයේ ගවේෂකයෝ වැඩි වශයෙන් පෙළැඹී ඇත.

19 වන සියවස තෙක් මිනිසා විශ්වාස කළේ ගැඹුරු මුහුද යනු ජීවයෙන් තොර ප්‍රදේශයක් ලෙස වුව ද, වර්තමානයේ දී විද්‍යාඥයන් විශ්වාස කරන්නේ ගැඹුරු මුහුද යනු අතිවිශාල ජෛව විවිධත්වයක් පවතින භූමි ප්‍රදේශයක් ලෙස ය. එහෙයින් සාගර පතුලේ භෞතික තත්ත්වයන්, රසායනික තත්ත්වයන් මෙන්ම ජෛව විවිධත්වයන් හඳුනා ගැනීම උදෙසා වර්තමානයේ ගවේෂණ සිදු කරමින් පවතී.




### සාගරයේ ගැඹුරුතම ස්ථාන

1. මරියානා අගාධය - බටහිර පැසිෆික් සාගරයේ පිහිටා තිබේ. ගැඹුර මීටර් 10,916කි. ගැඹුරුතම ස්ථානය 'චැලෙන්ජර් ඩීප්' (Challenger Deep) ලෙස හැඳින්වේ.

2. ටොන්ගා අගාධය - නිරිතදිග පැසිෆික් සාගරයේ පිහිටා තිබේ. ගැඹුර මීටර් 10,882කි. ගැඹුරුතම ස්ථානය 'හොරයිසන් ඩීප්' (Horizon Deep) ලෙස හැඳින්වේ.

3. පිලිපීන අගාධය - පැසිෆික් සාගරයේ පිලිපීන මුහුදේ පිහිටා තිබේ. ගැඹුර මීටර් 10,540ක් පමණ වේ. වසර මිලියන 8-9 කට පමණ බිහි වන්නට ඇතැයි සැලැකේ.

4. කුරිල්-කම්චැට්කා අගාධය - පැසිෆික් සාගරයේ කුරිල් දූපත ආසන්නයේ පිහිටා තිබේ. ගැඹුර මීටර් 10,500කි. සාගර පතුලේ සිදු වන ගිනිකඳු පිපිරීම් බොහොමයක් සිදු වන ප්‍රදේශයකි.

5. කර්මැඩෙක් අගාධය - දකුණු පැසිෆික් සාගරයේ පිහිටා තිබේ. ගැඹුර මීටර් 10,040ක් පමණ වේ. සෙ.මී. 34 පමණ දිගින් යුතු විශාල ඉස්සන් වැනි ජීවීන් මෙහි දී හමුවේ. 2014දී කර්මැඩෙක් අගාධය වෙත යැවුණු මිනිසුන් රහිත යාත්‍රාවක් අධික පීඩනය නිසා පුපුරා යන ලදී. නමුත්, 2022දී චීනය සහ නවසීලන්තය එක්ව යැවූ පර්යේෂකයන් කණ්ඩායමක් අගාධයේ පතුල දක්වා ළඟා වීමට සමත් විය.

6. ඉසු-ඔගසවාරා අගාධය - බටහිර පැසිෆික් සාගරයේ පිහිටා තිබේ. උපරිම ගැඹුර මීටර් 9,780ක් ලෙස සැලැකේ. ඉසු-බෝනින් අගාධය නමින් ද මෙය හඳුන්වනු ලබයි.

7. ජපන් අගාධය - උතුරු පැසිෆික් සාගරයේ ජපානයට ආසන්නව පිහිටා තිබේ. ගැඹුර මීටර් 9,000ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. භූමිකම්පා සහ සුනාමි තත්ත්වයන් ඇති කිරීමට බොහෝ සෙයින් බලපානු ලබන ප්‍රදේශයකි.


8. පෝට්‍රෝ රිකෝ අගාධය - අත්ලාන්තික් සාගරයේ කැරිබියන් මුහුදේ පිහිටා තිබේ. මීටර් 8,640ක් පමණ වන මෙහි ගැඹුරුතම ස්ථානය 'මිල්වවුකී ඩීප්' (Milwaukee Deep) නමින් හැඳින්වේ. මෙම කලාපයේ පිහිටි ගැඹුරුතම ස්ථානයයි.

9. සවුත් සැන්ඩ්විච් අගාධය - දකුණු ඇමෙරිකානු මහාද්වීපයට පහළින් දකුණු අත්ලාන්තික් සාගරයේ, දකුණු සැන්ඩ්විච් දූපත්වලින් කි.මී. 100ක් පමණ නැඟෙනහිර මුහුදේ පිහිටා තිබේ. උපරිම ගැඹුර මීටර් 8,420කි.


10. පේරු - චිලී අගාධය - අටකාමා අගාධය ලෙසින් ද මෙය හඳුන්වනු ලබයි. පේරු සහ චිලී වෙරළ තීරවලට කි.මී. 160ක් පමණ දුරින් නැඟෙනහිර පැසිෆික් සාගරයේ පිහිටා තිබේ. මීටර් 8,060ක උපරිම ගැඹුරකින් යුත් මෙම අගාධය වර්ග කි.මී. 5,90,000ක භූමියක් පුරා පැතිර ඇත.

### ගැඹුරු සාගර ගවේෂණයේ සන්ධිස්ථාන


- 1521 - ෆර්ඩිනන්ඩ් මැගලන් විසින් බරැති ලණුවක් ආධාරයෙන් පැසිෆික් සාගරයේ ගැඹුර මැනීමට උත්සාහ කරන ලදී. එහෙත්, ඔහුගේ කණ්ඩායමට සාගර පතුල සොයාගැනීමට නොහැකි විය.
- 1578 - එංගලන්ත ජාතික ගණිතඥයකු වූ විලියම් බෝන් (William Bourne) විසින් ප්‍රථම වතාවට ජලය තුළින් ගමන් කළ හැකි යාත්‍රාවක් ලෙස සබ්මැරීනයක සැලැස්මක් අඳින ලදී.
- 1620 - නෙදර්ලන්ත ජාතික ඉංජිනේරුවකු වූ කොර්නේලිස් ඩ්‍රෙබෙල් (Conelis Drebbel) විසින් ප්‍රථම සබ්මැරීනය නිපදවන ලදී.
- ප්‍රංශ ජාතික ස්වභාව විද්‍යාඥයකු මෙන්ම ඖෂධවේදියකු ද වූ අන්තෝනි රිසෝ (Antoine Risso) විසින් 1810 -1827 කාලය තුළ පළ කරන ලද කෘතිවල මීටර් 600 - 1,000 පමණ ගැඹුරු සාගරයේ ජීවත්වන ජීවී විශේෂ, පැළෑටි සහ




**1874 Challenger Expedition**
**චැලෙන්ජර් ගවේෂණ කණ්ඩායම**




**බේතිස්පියර් (Bathysphere) ගැඹුරු සාගර ගවේෂණ යාත්‍රාව**



**ඇමෙරිකානු ජාතික සාගර ජෛව විද්‍යාඥ විලියම් බීබේ (William Beebe) සහ කිමිදුම්කරුවකු වූ ඕටිස් බාර්ටොන් (Otis Barton)**




**ප්‍රථම වරට මරියානා අගාධය පතුලට ගමන්කල Trieste යාත්‍රාව**

සාගර පතුලේ පාෂාණ සම්බන්ධ සිය අධ්‍යයන පළකරන ලදී. ඔහු මේ සඳහා සාම්පල එක්රැස් කරගෙන තිබුණේ ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ නිරත ධීවරයන්ගෙනි.

✧ 1818දී බ්‍රිතාන්‍ය ජාතික පර්යේෂකයකුවූ සර් ජෝන් රොස් (Sir John Ross) විසින් මීටර් 2,000ක් (අඩි 6,500ක්) පමණ ගැඹුරු සාගරයේ ජීවීන් සිටින බව සොයාගන්නා ලදී. ඔහු භාවිත කළ විශේෂ උපකරණයක් ආධාරයෙන් එපමණ ගැඹුරු සාගරයේ ජීවත්වූ ජෙලිෆිෂ් පණුවන් ආදී ජීවීන් සොයා ගන්නා ලදී.

✧ බ්‍රිතාන්‍ය ජාතික ස්වභාව විද්‍යාඥයකුවූ එඩ්වඩ් ෆෝබ්ස් (Edward Forbes) විසින් සාගර ගැඹුරේ විවිධ මට්ටම්වලින් ලබාගත් ජීවී සාම්පල හරහා සිදුකරන ලද පරීක්ෂණවලදී දුටුවේ සාගරයේ



**ස්විට්සර්ලන්ත ජාතික ජැක්ස් පිකාඩ් (Jacques Piccard) සහ ඇමෙරිකානු ජාතික ඩොන් වොල්ෂ් (Don Walsh)**



**ඇමෙරිකානු ජාතික වික්ටර් වෙස්කොවෝ (Victor Vescovo)**

ගැඹුරට ගමන් කරද්දී, ක්‍රමානුකූලව ජීවී විශේෂ අඩුවන බවයි. ඒ අනුව මීටර් 300ට වැඩි සාගර ගැඹුරේ ජීවීන් සිටිය නොහැකි බව 1843දී ඔහු ප්‍රකාශ කළ අතර, එය 'ගැඹුරු අගාධ සිද්ධාන්තය' (Abyssus Theory) ලෙස නම් කරන ලදී. එතැන් පටන් වසර ගණනාවක් ගතවන තෙක් බොහෝ විද්‍යාඥයන් මෙය විශ්වාස කළ අතර, පසුකාලීනව ඊට වැඩි ගැඹුරු මුහුදේ ජීවීන් සොයා ගැනීමත් සමඟ මෙම සිද්ධාන්තය අතහැර දමන ලදී.

✧ 1850දී නෝර්වේ ජාතික විද්‍යාඥයකු වූ මයිකල් සාර්ස් විසින් මීටර් 800ක් ගැඹුරු මුහුදේ ජීවත්වන ජීවී විශේෂ සොයාගත් අතර ෆෝබ්ස්ගේ සිද්ධාන්තය අතහැර දැමීමට එය මූලික පියවරක් විය.

✧ ස්කොට් ජාතික සාගර ජීව විද්‍යාඥයකුවූ ශ්‍රීමත් චාල්ස් වයිවිල් තොම්සන්ගේ (Sir Charles Wyville Thomson) මූලිකත්වයෙන් 1872 -76 සිදුකරන ලද චැලෙන්ජර් ගවේෂණය (Challenger Expedition) (මෙම පරීක්ෂණ චාරිකාව සිදුකළ නෞකාවේ නමින් ගවේෂණය නම් කරන ලදී.) යනු ගැඹුරු සාගරය පිළිබඳව මිනිසා විසින් සිදු කරන ලද ප්‍රථම ක්‍රමවත් ගවේෂණය වේ. 1872දී එංගලන්තයේ පෝර්ට්ස්මවුත්වලින් ඇරැඹි මෙම පර්යේෂණ චාරිකාවේදී මහුද මතුපිටින් කිලෝ මීටර් 127,580ක පමණ දුරක් ගමන් කරමින් ගැඹුරු සාගර ගවේෂණ කටයුතු සිදුකර තිබූ අතර, එහිදී ගැඹුරු සාගරයේ ජීවත්වන නව ජීවී විශේෂ 4,000කට අධික සංඛ්‍යාවක් සොයාගෙන වර්ගීකරණය කරන ලදී.

✧ 1890 - 1898 ෆ්‍රාන්ස් ස්ටෙයින්ඩැච්නර් (Franz Steindachner) නම් ඔස්ට්‍රියානු ජාතික ජීව විද්‍යාඥයාගේ ප්‍රධානත්වයෙන් ඔස්ට්‍රෝ-හංගේරියාව විසින් ගැඹුරු සාගරය සම්බන්ධ පළමු ගවේෂණය සිදුකෙරිණි. මධ්‍යධරණී මුහුදේ නැගෙනහිර ප්‍රදේශයත්, රතු මුහුදත් පෝලා නම් නෞකාවේ ආධාරයෙන් මෙහිදී ගවේෂණයට ලක් කෙරිණි.

✧ ජර්මනිය විසින් මෙවැනි ගවේෂණයක් මුල්වරට සිදුකරන ලද්දේ 1898 - 1899 කාලයේදීය. වෝල්ඩිවියා නම් නෞකාව මගින් ජර්මානු සාගර ජීව විද්‍යාඥ කාල් චුන්ගේ (Carl Chun) නායකත්වයෙන් අත්ලාන්තික් සාගරයේ සිදුකළ මෙම ගවේෂණවලදී මීටර් 4,000කට වැඩි ගැඹුරු මුහුදේ ජීවත්වූ නව ජීවී විශේෂ රාශියක් හඳුනා ගන්නා ලදී.

✧ සාගරයේ අඩි 1,000 ඉක්මවූ ගැඹුරකට මිනිසා ප්‍රථම වරට පිවිසෙන්නේ 1930දීය. ඒ ඇමෙරිකානු ජාතික සාගර ජෛව විද්‍යාඥ විලියම් බීබේ (William Beebe) සහ කිමිදුම්කරුවකුවූ ඕටිස් බාර්ටොන් (Otis Barton)ය. ඔවුන් දෙදෙනා මීටර් 435ක ගැඹුරට එනම් අඩි 1,427ක ගැඹුරකට ළඟාවී සිටි අතර, එය සිදුකරන ලද්දේ 'බේතිස්පියර්' (Bathysphere) නම් වානේවලින් සාදන ලද අධික පීඩනයට ඔරොත්තු දිය හැකි කුටියක සිටය. එහිදී ඔවුනට එම ගැඹුරේ ජීවත්වන 'ජෙලිෆිෂ්' සහ කුනිස්සන් විශේෂ හමුවී ඇත.

✧ 1934 දී විලියම් බීබේ බේතිස්පියර් කුටීරය ආධාරයෙන් අඩි 3,028ක (මීටර් 923ක) ගැඹුරක් දක්වා ළඟාවන ලදී.

✧ ස්වීඩන් ජාතික හැන්ස් පීටර්සන් 1947 - 48 කාලයේදී සමකය හරහා නාවික සැතපුම් 45,000ක් පමණ මාස 15ක් තුළ ගවේෂණය කරමින්, 07 පිටුවට




# කියුබානු සහයෝගීතා මෙහෙයුම්වලට 60 වසරක් සපිරෙයි





1963 වසරේ සිට ආරම්භවූ කියුබානු සෞඛ්‍ය සේවකයන්ගේ ජාත්‍යන්තර සහයෝගීතා මෙහෙයුම්වලට පසුගිය මැයි 23 දිනට වසර 60ක කාලයක් සම්පූර්ණ විය. මෙම මෙහෙයුම් යටතේ ලොව පුරා රටවල් 165ක මිලියන 3ක ජනතාවකට ප්‍රතිකාර සපයා ඇති අතර, සහයෝගීතා මෙහෙයුම්වලදී කියුබානු වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලැබ තිබෙන ශල්‍යකර්ම ප්‍රමාණය මිලියන 16කි.


1963 මැයි 23 දින පළමු කියුබානු සහයෝගීතා වෛද්‍ය බළකාය ප්‍රංශ යටත්විජිතභාවයෙන් අලුත නිදහස ලැබූ ඇල්ජීරියාව බලා ගොස් තිබුණේ අගමැති අහමඩ් බෙන් බෙල්ලාගේ ඉල්ලීම පරිදි ය. කියුබානු නායක පිදෙල් කස්ත්‍රෝගේ මානවවාදී දෘෂ්ටිය මත පදනම්වූ මෙම සහයෝගීතා වෛද්‍ය සේවා සම්ප්‍රදායය ඉන්පසු අප්‍රිකාව හා ලතින් ඇමෙරිකාව පුරාත්, සෙසු මහාද්වීප කරාත් ව්‍යාප්ත විය. කියුබාව දශක හයක් පුරා මෙම සහයෝගීතා මෙහෙයුම්වල යෙදී සිටින්නේ කියුබානු විප්ලවයට එරෙහි එක්සත් ජනපද ආර්ථික, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික සම්බාධක මධ්‍යයේ ය.

# නැවතත් පණ ලබන දකුණු ඇමෙරිකානු සහයෝගීතාව

"අපේ ජනතාවට සාමකාමී හා යුක්තිසහගත අනාගතයක් අත්පත් කර ගැනීම වෙනුවෙන් මහාද්වීපික සංගමයක් ගොඩනැගීම පිළිබඳ අදහස බොලිවේරියානු විප්ලවය විසින් ආරක්ෂා කරනු ලබයි." වෙනිසියුලානු ජනාධිපති නිකොලාස් මදුරෝ මෙසේ පැවසුවේ, දකුණු ඇමෙරිකානු ජාතීන්ගේ සංගමයේ (UNASUR) ආරම්භක ගිවිසුම අත්සන් තබා වසර 15ක් සම්පූර්ණ වීමේ සංවත්සරයේ දී ය.

'මහාද්වීපික ඒකාබද්ධතාව' පිළිබඳ අදහස බොලිවේරියානු විප්ලවයේ නායක සිමොන් බොලිවාර් විසින් ඉදිරිපත් කරන ලද්දක්වූ අතර හියුගෝ චාවේස් වෙනිසියුලාවේ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව මෙම අදහස යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙන් විශාල වෙහෙසක් දැරී ය. ඒ අනුව 2008 මැයි 23වැනි දින වෙනිසියුලානු ජනාධිපති හියුගෝ චාවේස්ගේ සහ බ්‍රසීල ජනාධිපති ලූලා ද සිල්වාගේ මැදිහත්වීමෙන් බ්‍රසීලයේදී 'දකුණු ඇමෙරිකානු ජාතීන්ගේ සංගමය' (UNASUR) නිල වශයෙන් උපත ලැබී ය.

ආර්ජන්ටිනාව, බ්‍රසීලය, චිලිය, කොලොම්බියාව, ඉක්වදෝරය, ගයනාව, පැරගුවේ, පේරු, සුරිනාම්, උරුගුවේ සහ වෙනිසියුලාව මෙහි සාමාජිකත්වය දැරූ අතර, එම රටවල දක්ෂිණාංශික ආණ්ඩු පත්වූ අවස්ථාවල මෙම සංවිධානයෙන් ඉවත් වීම ද සිදු විය. කෙසේ වුව ද, ලතින් ඇමෙරිකානු කලාපය පුරා නැවතත් වාමාංශික සහ ප්‍රගතිශීලී ආණ්ඩු බලයට පත්වීමත් සමග 'දකුණු ඇමෙරිකානු ජාතීන්ගේ සංගමය' (UNASUR) නැවතත් ශක්තිමත් වෙමින් තිබේ. බොලීවියාව, සුරිනාම් හා වෙනිසියුලාව මෙම සංවිධානය




තුළ අඛණ්ඩව ක්‍රියාකාරීව සිටි අතර, බ්‍රසීල ජනාධිපති ලූලා ද සිල්වා පසුගිය අප්‍රේල් 06වැනි දින නැවත මෙම සංවිධානයට ඇතුළු වීමේ ගිවිසුමකට අත්සන් තැබී ය. එදිනම සන්තියාගෝ කැෆෙරෝ ආර්ජන්ටිනා විදේශ අමාත්‍යවරයා ද නිවේදනය කර ඇත්තේ, ඒකාබද්ධ කලාපයක් සඳහා වන යෝජනාව ශක්තිමත් කිරීම වෙනුවෙන් තම රට නැවත මෙම (UNASUR) සංවිධානයට ඇතුළු වන බව ය.

# අලුතින් ඇඳෙන මැදපෙරදිග නව බල සිතියම

'70 දශකයේ මුල මැදපෙරදිග තෙල් අර්බුදයෙන් පසුව 'ඔපෙක් සංවිධානය' ප්‍රමුඛ අරාබි ලෝකය තමන්ගේ පාලනයට ගැනීම වෙනුවෙන් එක්සත් ජනපදය විශාල ලෙස මැදිහත් විය. එහි විශාල පියවරක් වූයේ මැදපෙරදිග ප්‍රධානතම රටක්වන සෞදි අරාබිය තමන්ගේ අවනතභාවයට ගැනීම ය. එතැන් සිට සෞදියේ බොරතෙල්වලින් උපදින ධනය ඇමෙරිකානු බැංකුවල තැන්පත් කෙරෙන්නට පටන් ගත් අතර, සෞදි අරාබියේ ආරක්ෂාව ඇමෙරිකා එක්සත් ජනපදයේ වගකීමට යටත් විය. කුවේට් යුද්ධයේදී ද, ඉරාක යුද්ධයේදී ද සෞදි අරාබිය සිටියේ එක්සත් ජනපද කඳවුර තුළ ය.

එහෙත්, තව දුරටත් මැදපෙරදිග දේශපාලන කඳවුරු බෙදීම ඇමෙරිකා එක්සත් ජනපදයේ කැමැත්ත හා වුවමනාව පරිදි සිදු වන බවක් පෙනෙන්නට නැත. විශේෂයෙන් චීනයේ මැදිහත්වීම යටතේ සිදුවන සෞදි අරාබියේ නව හැසිරීම මෙම තත්ත්වය විදහා දක්වයි.

01. **සෞදි අරාබිය එක්සත් ජනපද විරෝධී රටවල් දෙකක් වන ඉරානය සහ සිරියාව සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා යළි ගොඩනගා ගැනීම - (මාර්තු 10)**
02. **සෞදි අරාබිය චීනය හා රුසියාව ප්‍රමුඛ 'ෂැන්හයි සහයෝගිතා සංවිධානයට' එක්වීමට තීරණය කිරීම - (මාර්තු 20)**
03. **සෞදි අරාබියේදී පවත්වන ලද 'අරාබි ලීගයේ' තිස්දෙවන වාර්ෂික සමුළුවට ඇමෙරිකානු විරෝධය මැද සිරියානු ජනාධිපති බෂාර් අල් අසාද්ට සහභාගි වීමට අවස්ථාව ලබා දීම - (මැයි 19)**

වසර 05කට පෙර කිසිසේත් සිදුවිය නොහැකි බවක් පෙනුණු ඉහත නව දේශපාලන වර්ධනයන් මගින් පැහැදිලි වන්නේ සෞදි අරාබිය මේ මොහොතේදී ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකානු විරෝධී කඳවුර සමග පෙළගැසෙමින් සිටින ආකාරයයි.

මීට අමතරව සිදුවූ තවත් වර්ධනයක් වූයේ මේ වසරේ නොවැම්බර්-දෙසැම්බර් මාසවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායිහි පැවැත්වීමට නියමිත 2023 දේශගුණ සමුළුව (COP28) සඳහා එහි නායක ෂෙයික් මොහොමඩ් බින් සයාඩ් අල් නයාන් විසින් සිරියානු ජනාධිපති බෂාර් අල් අසාද්ට ආරාධනා කරනු ලැබීම ය. බලයෙන් පහ කළ යුතු පාලකයකු ලෙස ලෙස එක්සත් ජනපදය නම් කළ ජනාධිපතිවරයකුට ජාත්‍යන්තර සමුළුවකට ආරාධනා කිරීම වර්ධනය වෙමින් පවතින නව ලෝක තත්ත්වයේම කොටසක් ලෙස හඳුනාගත හැකි ය.

## IMF ඉලක්ක සහ අපේ ආර්ථිකය .........

01 පිටුවෙන්

දක්වා කාලය තුළ මෙම කාඩ් ගනුදෙනුවලින් ඉවත්වූ ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව 23,000කට ආසන්න වේ. එය මුල ක්‍රෙඩිට් කාඩ් හිමියන්ගේ සංඛ්‍යාවෙන් 11%ක් තරම් ඉහළ ප්‍රතිශතයකි. එය පහත වගුවෙන් දැක්වේ.

| ක්‍රියාකාරී ක්‍රෙඩිට් කාඩ් සංඛ්‍යාව | 2022 දෙසැම්බර් | 2023 අප්‍රේල් |
|---|---|---|
| | 1,952.991 | 1,929,984 |

| IMF යෝජිත රාජ්‍ය බදු ආදායම - රු.බි. | | | | |
|---|---|---|---|---|
| මුළු බදු ආදායම සහ ප්‍රධාන | **2022** | **2023** | **2024** | **2025** |
| | 2,012 | 3,280 | 4,463 | 5,425 |

රාජ්‍ය ආදායමේ හැසිරීමද මෙම නිෂ්පාදනයේ අඩු වීමට සාපේක්ෂව

| රජයේ මුළු ආදායම - රු. බිලියන | | |
|---|---|---|
| මුළු බදු ආදායම සහ ප්‍රධාන | 2022 (ජන - මාර්තු) | 2023 (ජන - මාර්තු) |
| | 446 | 635 |

ඇස්තමේන්තු කළ ආදායමට ළඟා වීමට නොහැකි බවක් පෙන්නුම් කරයි. වෘත්තිකයන් සහ සාමාන්‍ය ජනතාව මත විශාල ලෙස බදු පනවා වුවද, රජයට එය එකතු කර ගැනීම පහසු නොවන්නේ ආර්ථිකය හැකිළීම තුළය. එනිසාම බදු ආදායම ඉහළ ගොස් ඇත්තේ බලාපොරොත්තු වූ ප්‍රමාණයට නොවේ.

ඉහත සංඛ්‍යාවලට අනුව 2023 වසර අවසාන වනවිට රජයේ මුළු ආදායම රුපියල් බිලියන 2,700 සීමාවේ නැවතීමට බොහෝ දුරට ඉඩකඩ තිබේ. එහෙත්, IMF යෝජනාවලට අනුව එය 3,280ක් විය යුතුය. එලෙසම 2024 වසර වන විට මෙම ආදායම දෙගුණයක් විය යුතුය. නිෂ්පාදනයේ විශාල පිම්මකින් තොරව එවැනි බදු ආදායමක් එකතු කර ගැනීමේ කිසිදු විභවයක් නොමැත. භාණ්ඩ මිල ඉහළ දමා ජනතාව මත විශාල බදු බරක් පැටවුවද ජනතාවට එය ගෙවා ගැනීමට නොහැකි වනු ඇත. ඒ අනුව බදු ආදායම සම්බන්ධයෙන් IMF තබා ඇති ඉලක්කයද සපුරා ගැනීමට නොහැකි මට්ටමේ ඉලක්කයක් වීමට බොහෝ දුරට ඉඩ තිබේ.

ඉහත සාධක සියල්ල සලකා බැලූ කල ලංකාවේ ආර්ථිකය දිනෙන් දින හැකිළෙමින් යන බවත්, ඒ අනුව IMF මඟින් ඉදිරිපත් කර ඇති ආර්ථික නිර්ණායක ළඟා කරගත නොහැකි තත්ත්වයකට පත්විය හැකි බවත්, 2023 වසරේ ගතවූ පසුගිය මාස කිහිපයේ හැසිරීම මගින් තහවුරු වේ. එයට ප්‍රධාන හේතුවක් බවට පත්වන්නේ නිසි දැක්මක්, අරමුණක් සහ කළමනාකරණයකින් තොරව ආර්ථිකය ඉබාගාතේ ගමන් කිරීමයි.

## ජූලි මාසය අඳුරු කර .......

03 පිටුවෙන්

### පංති චුවමනාව ඉටු කර ගැනීම

ඒ අතර ජේ. ආර්. ජයවර්ධන පාලනය තම ප්‍රමුඛ පංති චුවමනාව ඉටු කර ගැනීමට ඉක්මන් විය. ජූලි මාසයේ දෙමළ විරෝධී ප්‍රහාර මැද ආණ්ඩුවේ ප්‍රතිචාරය වඩාත් දරුණු අතට හරවමින් මුලින්ම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සහ නව සමසමාජ පක්ෂය මත මෙම සිදුවීම්වල වරද පටවන ලදී. දින කිහිපයකට පසුව එම පක්ෂ තුන ජාතිවාදී ප්‍රහාරවල පිටුපස සිටි බවත්, ඒ පක්ෂ ඊට වගකිව යුතු බවත් ආණ්ඩුව දිගින් දිගටම ගුවන්විදුලියෙන් ප්‍රචාරය කළේය. ඒ අනුව 1983 ජූලි අග හදිසි නීතිය යටතේ ජනතා විමුක්ති පෙරමුණත්, නව සමසමාජ පක්ෂයත්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයත් තහනම් කරන ලදී. "ජාතිවාදී සිදුවීම් මුවාවෙන් රාජ්‍ය බලය බලහත්කාරයෙන් ලබා ගන්නට කුමන්ත්‍රණය කළේය" යන්න ඔවුන්ට එල්ල වූ චෝදනාවයි. ඔවුන්ට ආරක්ෂාව සපයන ඕනෑම කෙනකුගේ දේපළ රාජසන්තක කරන බවද ආණ්ඩුව මහජනයාට දැනුම් දුන්නේය. අත්අඩංගුවට අවශ්‍යව සිටින පුද්ගලයන් වශයෙන් ආණ්ඩුව ඒ පක්ෂ තුනේ නායකයන් නම් කරන ලදී.

කොමියුනිස්ට් පක්ෂයේ නායකයෝ මුලින්ම ආණ්ඩුවට භාරවූහ. ඔවුහු කාලයක් මීගමුව බන්ධනාගාරයේ රඳවාගෙන සිටියහ. පසුව පරීක්ෂණයක් කළ බව කියා ඔවුන් නිදහස් කළ අතර, පක්ෂ තහනම ඉවත් කරන ලදී. නව සමසමාජ පක්ෂයේ නායකයන්ද පොලිසියට භාරවූ අතර, පසුව ඔවුන්ද නිදහස් කර පක්ෂ තහනමද ඉවත් කරන ලදී. නමුත්, ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ පොලීසියට භාර නොවූහ.

ඒ නිසා ජ.වි.පෙ. තහනම එලෙසම පැවැති අතර, එහි නායකයන් සොයා ගැනීමට ආණ්ඩුව අපොහොසත් විය. මෙසේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය තුළ ඉතා හොඳින් කටයුතු කරමින් සිටි දේශපාලන පක්ෂයක් කිසිදු සාධාරණ හේතුවකින් තොරව තහනම් කිරීම වසර කිහිපයකට පසු රට තුළ මහත් බිහිසුණු තත්ත්වයක් ඇතිවීම දක්වා දුරදිග ගියේය.

## ගැඹුරු සාගරයේ ගවේෂණ .......

04 - 05 පිටුවෙන්

පරීක්ෂණ කටයුතු සඳහා ගැඹුරු මුහුදු පතුලේ ඇති මඩ සහ පාෂාණ එක්රැස් කරන ලදී.

- ✧ 1948දී ඕටිස් බාර්ටොන් බේතිස්පියර් කුටීරය මඟින් අඩි 4,495ක (මීටර් 1370ක) ගැඹුරකට ළඟා වෙමින් නව වාර්තාවක් පිහිටුවන ලදී.
- ✧ 1960දී ප්‍රථම වරට සාගරයේ ගැඹුරුතම ස්ථානය වන මරියානා අගාධයේ පතුලටම ළඟා වීමට ස්විට්සර්ලන්ත ජාතික ජැක්ස් පිකාඩ් (Jacques Piccard) සහ ඇමෙරිකානු ජාතික ඩොන් වොල්ෂ් (Don Walsh) සමත් වූහ. ඒ ස්විට්සර්ලන්ත සැලැසුම්වලට අනුව ඉතාලියේ නිපදවන ලද ට්‍රියස්ටෙ (Trieste) නම් කුටීරය මඟිනි. ඔවුන් ළඟා වූ ගැඹුර මීටර් 10,911ක් (අඩි 35,797ක්) විය. 1958දී මෙම කුටීරය එක්සත් ජනපදය විසින් මිලදී ගෙන තිබිණි.
- ✧ ✧ 2012දී 'ඩීප් සී චැලෙන්ජර්' (Deep Sea Challenger) නම් කුටීරය හරහා මරියානා අගාධයේ පතුලට ළඟා වූ ලෝකප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂකවරයකු වන ජේම්ස් කැමරන් (James Cameron) මරියානා අගාධයේ පතුල රූපගත කිරීමට සමත් විය. තනි පුද්ගලයකු මරියානා අගාධයේ පතුලට ළඟා වූ පළමු අවස්ථාව මෙය වෙයි.
- ✧ 2018දී ඇමෙරිකානු ජාතික වික්ටර් වෙස්කොවෝ (Victor Vescovo) අත්ලාන්තික් සාගරයේ ගැඹුරුතම ස්ථානය වන පෝට්‍රෝ රිකෝ අගාධයට ළඟා වීමට සමත් විය. එහි ගැඹුර මීටර් 8,375 (අඩි 27,477)ක් වේ. මේ සඳහා යොදා ගත් DSV Limiting Factor නම් යාත්‍රාව සමඟ වික්ටර් වෙස්කොවෝ 2019 වසරේදී දක්ෂිණ සාගරයේ ගැඹුරුම ස්ථානය වන 'සවුත් සැන්ඩ්විච් ට්‍රෙන්ච්' (South Sandwich Trench) (මීටර් 8,296), ඉන්දියානු සාගරයේ ගැඹුරුම ස්ථානය වන 'සුන්ඩා ට්‍රෙන්ච්' (Sunda Trench) (මීටර් 7290), ආක්ටික් සාගරයේ ගැඹුරුම ස්ථානය වන 'මොලෝයි ඩීප්' (Molloy Deep) (මීටර් 5550) සහ ටොන්ගා අගාධයේ ගැඹුරුම ස්ථානය වන 'හොරයිසන් ඩීප්' (Horizon Deep) (මීටර් 10,800) වෙත ළඟා වීමට සමත් විය. මරියානා අගාධයේ පතුල දක්වාද කිහිප වරක් ගමන් කර ඇති ඔහු පෘථිවිය මත ඇති ප්‍රධාන සාගර පහේම ගැඹුරුතම ස්ථාන දක්වා ගමන් කර ඇති ප්‍රථම පුද්ගලයා ලෙස සැලැකේ.
- ✧ 2020දී ඉහත යාත්‍රාව මඟින්ම මරියානා අගාධයේ ගැඹුරුතම ස්ථානයට ගමන් කළ ආචාර්ය කැතරින් සුලිවන් (Kathryn Sullivan) සහ වැනෙස්සා ඕබ්‍රින් (**Vanessa O'Brein**) එම ක්‍රියාව සිදුකළ ප්‍රථම කාන්තාවෝ දෙපළ බවට පත්වූහ.

# ආගම හා දේශපාලනය

**ලපාදුවේ ලෝකය තුළ මෙන්ම ශ්‍රී ලංකාවේද දේශපාලන ගමන්මග තුළ ආගමේ බලපෑම තීරණාත්මක සාධකයක්වී තිබේ. ඉතිහාසයේ විවිධ වකවානු තුළදී මෙම බලපෑම අඩු-වැඩි වශයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන්මගට සිදු කරනු ලැබූ බලපෑම පිළිබඳ අත්දැකීම් අපට තිබේ. 1948න් පසු ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට රට පත්වී ඇති තත්ත්වයක් තුළ එහි දේශපාලන ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයක් වෙතද රට ළඟාවී තිබේ. මෙම විශේෂ තත්ත්වය තුළ ආගම් කේන්ද්‍ර කර ගනිමින්, යම් සමාජ ව්‍යාකූලභාවයක් ඇතිකිරීමේ තත්ත්වයක් සියුම් ලෙස මතු කෙරෙමින් තිබෙන බව හඳුනාගත යුතුය. මෙම සංක්ෂිප්ත කෙටි ලිපිය ඒ වෙනුවෙන්වූ ප්‍රවේශයකි.**

### ආගමේ බිහිවීම

ආගම් බිහිවූයේ අවිද්‍යාව තුළය. සොබාදහම හමුවේ අසරණවූ ආදිකල්පික මිනිසාට තමා අවට සිදුවන්නාවූ ස්වාභාවික සංසිද්ධි වටහා ගැනීමට අසීරු විය. ඉර, හඳ, තාරකා, අව්ව, වැස්ස, ගින්දර... ආදී ස්වාභාවික වස්තුවල සහ ක්‍රියාවලිවල හරය වටහා ගැනීමට තරම් දැනුමක් මෙම අවධිය තුළ නොතිබිණි. උපකරණවල සංවර්ධනය ඉතාමත් පහළ අවධියකදී (ප්‍රාථමික සාමූහික සමාජය තුළ) මිනිසුන්ගේ දැනුම් මට්ටමද ඊට අනුරූපව පැවතීම යථාර්ථයයි. තමාට වටහා ගැනීමට නොහැකි සියලු දේවලට දේවමය බලයක් ආරෝපණය කිරීම සිදුවන්නේ මේ තත්ත්වය තුළය. විවිධ විෂය කාරණා සඳහා දෙවිවරුන් මණ්ඩලයක් නිර්මාණය කරනු ලැබීය. (නිදසුනක් ලෙස ග්‍රීසියේදී අහස - සියුස්, හිරු - ඇපලෝ... ආදී ලෙස) එලෙසම එදිනෙදා පරිහරණය කරන දේවල් තුළද ආත්මයක් ඇතැයි විශ්වාස කරනු ලැබීය. මෙය 'ප්‍රාණවාදය' ලෙස හඳුන්වනු ලබයි. බ්‍රිතාන්‍ය ජාතික මානව විද්‍යාඥයකුවූ ශ්‍රීමත් එඩ්වඩ් බර්නෙට් ටයිලර් (Sir Edward Burnett Tylor 1832-1917) රචිත 'ප්‍රිමිටිව් කල්චර්' (ආදිකල්පික සංස්කෘතිය ['Primitive Culture']) ග්‍රන්ථයෙහි 'ප්‍රාණවාදය' ආගමික භක්තියෙහි පූර්ව අවධියක් ලෙස පැවති බව ඔහු සඳහන් කරයි. ප්‍රාණවාදය ආගමක් ලෙස නොසලකන අතර, එය ආගමක් ගොඩනැංවීම සඳහා පාදක වන මූලික අවශ්‍යතාවක් ලෙස සලකනු ලබයි. ටයිලර්ගේ අර්ථදැක්වීමට අනුව ප්‍රාණවාදය ආත්මය කෙරෙහි ඇදහීමකි. එයින් දේව ඇදහිලි හෝ මිනිස් ශරීරයෙන් පරිබාහිර ආත්ම කෙරෙහි විශ්වාස කරන සියලු ආගම් කෙරෙහි පදනම සකස් කෙරෙන බව ඔහු පවසයි.

සමාජ සංවර්ධන ක්‍රියාවලියේදී ප්‍රාථමික සාමූහික සමාජය අභාවයට යමින්, පන්ති සමාජය බිහිවීමේදී මෙම ඇදහිලි සහ විශ්වාස සංවිධානාත්මක ආගම් බවට පරිවර්තනය විය. බොහෝ දෙවියන් ඇදහීම වෙනුවට එක් දෙවියකු විශ්වාස කරන ආගම්ද බිහි විය. සංවිධානාත්මක ආගම්වල පැවැත්ම තීරණය වූයේ ඒ වෙනුවෙන් වෙන්වූ පූජකවරුන්ගේ හෝ ආගමික නායකයන්ගේ හෝ පැලැන්තියක් නඩත්තු කිරීමේ හැකියාව තුළය. මෙවැනි පිරිසක් නඩත්තු කිරීම සඳහා අතිරික්ත ධනයක් ප්‍රාථමික සමාජය තුළ නොතිබුණු අතර, එම තත්ත්වය ගොඩනැගුණේ පන්ති සමාජය තුළදීය. සමාජ නිෂ්පාදනයේ අතිරික්තය දේපළ හිමි පන්තිය සතු විය. එම නිසාම ආගම්වල පැවැත්ම උදෙසා දේපළ හිමි පාලක පන්තියේ සහාය ඊට අවශ්‍ය වූවා සේම තම සූරාකෑම සාධාරණීයකරණය කර ගැනීම සඳහා ජනතාව මෝහනය කොට තබා ගැනීමට දේපළ හිමි පාලක පන්තියට ආගම්වල සහාය අවශ්‍ය විය. ඒ සමග ආගම පාලක පන්තියේ අවිය බවට පත්විය.

රජයේ පීඩාවලට එරෙහිව පීඩිතයන් වෙනුවෙන් බිහිවූ ආගම්ද පසුකාලීනව ඉහත තත්ත්වයට පත් විය. ආගමේ බිහිවීම සහ භාවිතාව පිළිබඳ සංක්ෂිප්ත කතාව එයයි.

### ආගම යනු කුමක්ද?

ආගම යනු ප්‍රකෘතියේ විකෘති කරනු ලැබූ මනඃකල්පිත පිළිබිඹුවක් ලෙස මාක්ස්වාදය විසින් හඳුනා ගනු ලබයි. ආගම වද මලකට උපමා කරන ලෙනින් එය හට ගත්තේ 'මිනිසා' නමැති වෘක්ෂයේ බවත්, සමාජ සංවර්ධනයේදී සමාජ සංවර්ධනයේදී එය ප්‍රතිගාමී කාර්යයක් ඉටු කරනු ලැබුවද, ආගමික අගතිවලට එරෙහිව කටයුතු කිරීමේදී අතිශයින් සැලැකිලිමත් විය යුතු බවත් අවධාරණය කර ඇත. එය පහත උපුටනයෙන් වඩාත් පැහැදිලි වෙයි.

**"ආගමික අගතීන්ට එරෙහිව සටන් කිරීමේදී අප අතිශයින්ම ප්‍රවේසම්කාරී විය යුතුය. ඇතැම් මිනිස්සු ආගමික හැඟීම් රිදවීම් මගින් මේ අරගලයේදී විශාල හානියක් සිදු කරත්. අප විසින් මෙහිදී ප්‍රචාරක කටයුතු සහ අධ්‍යාපනය උපයෝගී කරගත යුතුය. අරගලයට ඕනෑවට වඩා තියුණු මුවහතක් දීමෙන් අප කරන්නේ ජනතා නුරුස්නාව ඇවිස්සීම පමණි."**

ආගම පිළිබඳ ලෙනින්ගේ මෙම අදහස අදට වඩාත් කාලෝචිත වෙයි. දේවගැති ජෙරම් නම් පුද්ගලයකු හරහා මෙන්ම නටාෂා නමැති සමාජ මාධ්‍ය ක්‍රියාකාරිනියක හරහාද සමාජය නොසන්සුන් කරන භාවිතාවක් අපට දැකගත හැකි විය. බුදුදහමට අපහාස කරනු ලැබූ බවට මොවුන් දෙදෙනාටම චෝදනා එල්ලවූ අතර, ඒ සමගම රටේ මූලික ප්‍රශ්න මොහොතකට යට ගොස් ආගමික භක්තිය පදනම් කර ගත් හැඟීම්බර ක්‍රියාකාරීත්වයක් දින කිහිපයකට හෝ මතු විය. වඩාත් හොඳින් විමර්ශනශීලීව බැලූ විට දක්නට ලැබෙන්නේ මේවා තුළ යම් කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළක් සැඟව ඇති බවයි.

සම්ප්‍රදායයට එරෙහිවීම, මිථ්‍යා විශ්වාසවලට එරෙහිව කටයුතු කිරීම, ආගමික අගතිවලට එරෙහිව කටයුතු කිරීම වැනි රැඩිකල් ක්‍රියාමාර්ග වියුක්තව ගත් විට ප්‍රගතිශීලී වෙයි. නමුත්, එය සිදු කරන මොහොත මෙන්ම ආකාරයද අනුව දැන හෝ නොදැන ප්‍රතිගාමී භාවිතාවලටද පණ පෙවෙන බව තේරුම්ගත යුතුය. එමෙන්ම ජනතා විශ්වාසවලට අපහාස කිරීම් වැනි ක්‍රියාදාම මගින්ද සිදුවන්නේ ජනතාව මිථ්‍යාවෙන් ගැලවීම වෙනුවට ඔවුන් තව තවත් තම ගතානුගතික විශ්වාසවලට තදින් බැඳෙමින්, ඒවා ආරක්ෂා කිරීමට යොමුවීමයි. කර වටක් ගිලී ඇති සමාජ, ආර්ථික, දේශපාලන ගැටලු විසඳ ගැනීම උදෙසා සමාජ පරිවර්තනයකට සියලු මතවාද පෙළගැස්විය යුතු, එය ඉලක්ක කර ගත යුතු මොහොතක ජන මනෝභාව වෙනතකට හරවන පෙනුමින් රැඩිකල් ලෙස පෙනෙන ක්‍රියාකාරකම්වල පවතින ප්‍රතිගාමී දේශපාලනයද මේ මොහොතේ හොඳින් වටහාගත යුතුය.



"දේශපාලනයේදී ජනතාව හැමදාමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරු වී ඇත. එමෙන්ම සියලුම සදාචාර, ආගමික, දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් සහ පොරොන්දු පිටුපස තිබෙන කිසියම් එක් හෝ අනෙක් පන්තියක වුවමනාවන් සොයා, තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත."

**(ලෙනින්, තෝරා ගත් කෘති, 1 වැනි වෙළුම, 52 වැනි පිටුව.**